# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

# பொலிஸ் ஊடகப் பிரிவு

# POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.29 පැය 1410 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1961/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**අසනීප තත්ත්වයක් හේතුවෙන් පුද්ගලයින් දෙදෙනෙකු මියයාම - නොරොච්චෝලය පොලිස් වසම.**

2025.10.28 වන දින උදෑසන කාලයේ නොරොච්චෝල පොලිස් වසමේ ලක්විජය විදුලි බලාගාරය ආසන්න මුහුදු වෙරළේ මාදැල් වාඩියක සිටි සේවකයින්ගෙන් එක් අයෙකු අසනීප තත්ත්වයක් හේතුවෙන් පුත්තලම රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇති බවත්, 2025.10.29 වන අද දින උදෑසනද ඉහත සඳහන් වාඩියේ තවත් පුද්ගලයෙකු මියගොස් ඇති බවටත් නොරොච්චෝලය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුවන් අවුරුදු 28 හා 49 වයස්වල පසුවන 04 කණුව, පුත්තලම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෙම සේවකයින් පෙර දින කිහිපයකදී මුහුදේ පාවෙමින් තිබූ බෝතලයක අඩංගු ද්‍රාවණයක් විටින් විට පානය කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර එම ද්‍රාවණය පානය කරන ලද තවත් සේවකයින් දෙදෙනෙකුද පුත්තලම රෝහලට ඇතුලත්ව ප්‍රතිකාර ලබයි.

නොරොච්චෝලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**